## මූල්‍ය හා බැංකු කටයුතු සංවර්ධනය

### මුදල් සැපයුම

මුදල් සැපයුමෙහි තියුණු වැඩිවීම නොකඩවා පැවති දෙවසරකට පසුව මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය සැළකිය යුතු ලෙස පසුබෑම, 1978 වසරේ මූල්‍ය කටයුතු සංවර්ධනයන්හි වූ මූලික ලක්ෂණය විය. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවල එකතුව ලෙස සැලකෙන මුදල් සැපයුම, වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 570 කින් හෙවත් සියයට 11 කින් වැඩි විය. මෙය, 1976 සහ 1977 වර්ෂ වලදී පිළිවෙලින් සියයට 35 ක් හා සියයට 29 ක් වූ මුදල් සැපයුමේ වාර්ෂික වැඩිවීම හා සැසඳිය හැක. 1977 වර්ෂය මුළුල්ලෙහිදීම ඉකුත් වසරේ අනුරූප මාසයන්හි පැවති මුදල් සැපයුම් මට්ටමට වඩා සියයට 25 ක් ඉක්ම වූ වාර්ෂික වැඩිවීම සිදුවුන ද, 1978 වර්ෂයේදී එකී මට්ටම ඉක්මවන අන්දමේ මුදල් සැපයුමේ වාර්ෂික වැඩිවීම සිදුවූයේ මුල් මාස හතර තුළදී පමණි. 1.15 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරන පරිදි, ජනවාරි මාසයේදී සියයට 35 ක්ව පැවති වාර්ෂික මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය, ජූලි මාසය වනවිට සියයට 14 දක්වා ක්‍රමයෙන් පහත වැටුණ අතර එතැන් සිට එම මට්ටමට ආසන්න වූ මට්ටමක තරමක් දුරට නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, 1978 දෙසැම්බර් මාසයේදී මුදල් සැපයුමේ කැපී පෙනෙන පහත වැටීමක් වාර්තා වූයෙන්, එය සියයට 11 දක්වා, අඩුවිය. මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ පසුබැස්ම සලකා බලන කල, 1977 දී සියයට 2·1 ක්ව පැවති මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍ය වැඩිවීම 1978 දී සියයට 0·9 දක්වා පහත වැටුන අතර, ඉකුත් වසරේ අනුරූප මාසයන්හි පැවති මට්ටමට වඩා මුදල් සැපයුම වැඩිවීමේ මාසික සාමාන්‍යය සියයට 32 සිට සියයට 20 දක්වා අඩු විය.

මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය අඩුවීමට හේතු වූ ප්‍රධානතම සාධකයන් වූයේ රාජ්‍ය අංශයේ මූල්‍ය කටයුතු වලින් හටගත් සංකෝචනාත්මක බලපෑම සහ බැංකු නොවන පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතුරුම් තැන්පතු වල වූ සැළකියයුතු වර්ධනයයි. වර්ෂය තුළදී, රජයේ ආදායම සහ ප්‍රසාරණාත්මක නොවන මූලාශ්‍රයන්ගෙන් ලබාගත් ණය ගැනීම, රජයේ මුළු වියදමට වඩා සැළකියයුතු ප්‍රමාණයකින් වැඩි විය. මේ අනුව, මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් වල (ශුද්ධ) වෙනස්වීම් ඇතුළුව රාජ්‍ය අංශයේ කටයුතු මගින් මුදල් සැපයුම මත රුපියල් දශලක්ෂ 1,520 ක සංකෝචනාත්මක බලපෑමක් ඇති විය. අනෙක් අතට, වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 3,000 කට තරමක් වැඩි වූ පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණයවල වාර්තාගත වැඩිවීමක් තිබියදීත්, මෙම අංශයේ කටයුතුවලින් වූ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 688 කට සීමා වුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු සැළකිය යුතු ලෙස වැඩිවීමයි. ඉතුරුම් තැන්පතු වල මෙම වැඩිවීම වර්ෂය තුළදී පැවති ඉහළ පොලී අනුපාතික ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් විය.

1978 වර්ෂයේ මූල්‍ය කටයුතු සංවර්ධනයන් මගින් මූල්‍ය වර්ධන රටාව තුළ වාරික වශයෙන් ඇතිවන ඇතැම් සාධකයන් නැවත මතු වී පෙනුන බව පැහැදිලි වේ. සාමාන්‍යයෙන්, සමුපකාර ආයතනයන්ට දෙන ලද බැංකු ණය සෑම වර්ෂයකදීම එහි ප්‍රථම භාගය තුළදී තියුණු ලෙස ඉහළ නැගෙන අතර, සිව්වන කාර්තුව තුළදී ඒ හා සමාන වේගයකින් පහත වැටීමක්, දක්නට ලැබේ. මෙම අංශයට දෙන ලද බැංකු ණය 1978 ජුනි මාසය වන විට රුපියල් දශලක්ෂ 1,922 දක්වා ඉහළ නැගුණද, දෙසැම්බර් මාසය වන විට එය රුපියල් දශලක්ෂ 1,675 දක්වා පහත වැටුණි. වෙළඳ බැංකු ක්‍රමය තුළ වී අලෙවි මණ්ඩලය වෙනුවෙන් කල්පිරුණු භාණ්ඩ කුවිතාන්සි පියවීම සඳහා අවිනිශ්චිතව රඳවා ගත් රුපියල් දශලක්ෂ 297 ක් හා කල් පමාවූ භාණ්ඩ කුවිතාන්සි සඳහා රඳවාගත් රුපියල් දශලක්ෂ 171 ක් නොවන්නට මෙම අංශයට දෙන ලද බැංකු ණය වෙනස් වීමෙහි වාරික රටාව වඩාත් හොඳින් කැපී පෙනෙන්නට ඉඩ තිබුණි. වසරේ මුල් භාගය තුළදී විශාල ලෙස වූ වී මිල දී ගැනීම පිළිබිඹු කරමින්, කල් පිරෙමින් පැවති භාණ්ඩ කුවිතාන්සි ප්‍රමාණය වසරේ අවසාන කාර්තුවේදී ඉතා ඉහල මට්ටමක තිබීම නිසා අවිනිශ්චිත ගිණුමේ පවත්වාගත් මුදල් ප්‍රමාණය අසාමාන්‍ය ලෙස වැඩිය. කෙසේ වුවද කිසිම වාරික ලක්ෂණයක් පෙන්නුම් නොකළ අනිකුත් අංශයන්ගේ හැසිරීම් මගින් මෙම අංශයට ගලා ආ බැංකු ණයෙහි වූ වාරික ලක්ෂණයන් මුළුමණින්ම මකාදමන ලදී. විශේෂයෙන්ම, දෙවෙනි කාර්තුවේ දී හැර අනෙකුත් සෑම කාර්තුවකදීම විශාල වැඩිවීම් වාර්තා වූ බැංකු විදේශීය වත්කම්වල වර්ධනය සහ කාර්තු හතරෙහිම සැළකිය යුතු සංකෝචනාත්මක බලපෑමක් ඇතිකළ රාජ්‍ය අංශයේ කටයුතු වල බලපෑම නිසා වර්ෂය තුළදී මුදල් සැපයුම් වර්ධනයෙහි ඇතිවන වාරික නැඹුරු වීම් කිසිවක් පෙන්නුම් නොකරයි.

## 1·15 වැනි සංඛ්‍යා සටහන

## මුදල් සැපයුමේ වෙනස්වීම 1976 – 1978

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | මුදල් සැපයුම – රුපියල් දශලක්ෂ | | | මාසික වෙනස% | | | පසුගියවසරට වඩා වූ වෙනස % | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1976 | 1977 | 1978 | 1976 | 1977 | 1978 | 1975 හා 1976 | 1976 හා 1977 | 1977 හා 1978 |
| ජනවාරි .. .. | 3,127 | 4,203 | 5,679 | + 0·3 | + 0·9 | + 5·8 | + 6·4 | + 34·4 | + 35·1 |
| පෙබරවාරි .. .. | 3,213 | 4,429 | 5,830 | + 2·7 | + 5·4 | + 2·7 | + 9·7 | + 37·9 | + 31·6 |
| මාර්තු .. .. | 3,391 | 4,710 | 6,001 | + 5·5 | + 6·3 | + 2·9 | + 11·4 | + 38·9 | + 27·4 |
| අප්‍රේල් .. .. | 3,516 | 4,764 | 6,025 | + 3·7 | + 1·2 | + 0·4 | + 15·4 | + 35·5 | + 26·4 |
| මැයි .. .. | 3,582 | 4,808 | 5,876 | + 1·9 | + 0·9 | — 2·5 | + 20·5 | + 34·2 | + 22·2 |
| ජූනි .. .. | 3,728 | 4,947 | 5,864 | + 4·1 | + 2·9 | — 0·2 | + 23·2 | + 32·7 | + 18·5 |
| ජූලි .. .. | 3,666 | 4,893 | 5,570 | — 1·7 | — 1·1 | — 5·0 | + 23·0 | + 33·5 | + 13·8 |
| අගෝස්තු .. .. | 3,851 | 4,912 | 5,523 | + 5·1 | + 0·4 | — 0 8 | + 31·3 | + 27·5 | + 12·4 |
| සැප්තැම්බර් .. .. | 3,889 | 5,024 | 5,804 | + 1·0 | + 2·3 | + 5·1 | + 28·9 | + 29·2 | + 15·5 |
| ඔක්තෝබර් .. ., | 3,988 | 5,062 | 5,835 | + 2·5 | + 0·7 | + 0·5 | + 30·9 | + 26·9 | + 15·3 |
| නොවැම්බර් .. .. | 4,019 | 5,254 | 5,955 | + 0·8 | + 3·8 | + 2·1 | + 31·9 | + 30·7 | + 13·3 |
| දෙසැම්බර් .. .. | 4,166 | 5,366 | 5,936 | + 3 7 | + 2·1 | — 0·3 | + 34·9 | + 28·8 | + 10·6 |
| මාසික සාමාන්‍යය .. | 3,678 | 4,864 | 5,825 | + 2·5 | + 2·1 | + 0·9 | + 22·4 | + 32·5 | + 20·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1978 වර්ෂයේ මුදල් සැපයුමෙහි සංයුතිය හා මූල්‍ය ප්‍රසාරණයට බලපෑ ප්‍රධාන සාධකයන් 1·16 වෙනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. වර්ෂය තුළදී බැංකු නොවන පෞද්ගලික අංශයේ ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 347 කින් ඉහළ නැගුණු අතර මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් රුපියල් දශලක්ෂ 224 කින් වැඩි විය. බැංකු විදේශීය වත්කම් වල තියුණු වැඩි වීම සහ පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය ප්‍රසාරණය 1978 මුදල් සැපයුමෙහි වර්ධනයට දයක වූ ප්‍රධානතම සාධකයන් විය. 1978 වර්ෂය, විදේශීය අංශය මගින් මුදල් සැපයුම මත සැළකිය යුතු ප්‍රසාරණාත්මක බලපෑමක් පිළිවෙලින් ඇති කළ තෙවන වර්ෂය විය. 1976 දී හා 1977 දී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 470 ක හා රුපියල් දශලක්ෂ 1,943 ක වැඩිවීම් වාර්තා කළ බැංකු සතු ශුද්ධ විදේශීය වත්කම් (විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් සඳහා ඉඩ හල) පසු 1978 දී තවදුරටත් රුපියල් දශලක්ෂ 1,523 කින් වැඩි විය. සාමාන්‍යයෙන් දක්නට ලැබෙන පරිදි, මෙම වැඩිවීමෙන් විශාල කොටසක් පිළිබිඹු වුයේ මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි. බැංකු විදේශීය වත්කම්වල වර්ධනයට මුළුමනින්ම හේතු වූයේ ගෙවුම් තුලනයේ ප්‍රාග්ධන ගිණුමෙහි වැඩිවූ සම්පත්ය. 1977 නොවැම්බර් සිට ආනයන සහ ගෙවීම් නිදහස් කිරීම තරමක් දුරට පිළිබිඹු කරමින් වර්තන ගිණුමෙහි සැළකිය යුතු හිඟයක් වාර්තා වුවද, ප්‍රාග්ධන ගිණුමෙහි වූ සම්පත් මෙම හිඟය පියවීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩි වූයෙන්, එම අතිරික්තය රටෙහි විදේශීය වත්කම් ශක්තිමත් කිරීමට ඉවහල් විය.

### 1·16 වැනි සංඛ්‍යා සටහන

### මුදල් සැපයුමේ වෙනස්වීම් සහ ඒ කෙරෙහි බලපෑ සාධක
### 1976 - 1978

රුපියල් දශලක්ෂ වලින්

| | 1975/1976 අග | 1976/1977 අග | 1977/1978 අග |
|---|---|---|---|
| 1· සැකැස්ම | | | |
| 1·1 ඉල්ලුම් තැන්පතු .. .. | + 607 | + 489 | + 347 |
| 1·2 ව්‍යවහාර මුදල් .. .. | + 471 | + 711 | + 224 |
| 2· මුදල් සැපයුමේ ශුද්ධ වෙනස්වීම් .. | + 1,077 | + 1,200 | + 570 |
| 3· විශ්ලේෂණය .. .. | | | |
| 3·1 බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)* .. | + 470 | + 1,943 | + 1,523 |
| 3·2 පෞද්ගලික අංශය .. .. | + 70 | — 70 | + 668 |
| 3·2·1 වෙළඳ බැංකු ණය .. | | | |
| — රාජ්‍ය සංස්ථාවන්ට .. | + 43 | + 614 | + 693 |
| — සමුපකාර ආයතනයන්ට .. | + 113 | + 568 | + 443 |
| — පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනු කරුවන්ට .. | + 427 | + 618 | + 1,890 |
| 3·2·2 කාලීන හා ඉතුරුම් තැන්පතු | | | |
| — රාජ්‍ය සංස්ථා සතු .. | + 42 | — 294 | — 200 |
| — සමුපකාර ආයතනයන් සතු .. | — 21 | — 45 | — 54 |
| — පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනු කරුවන් සතු .. | — 487 | — 856 | — 1,351 |
| 3·2·3 වෙළෙඳ බැංකුවල අනෙකුත් වත්කම් හා වගකීම් (ශුද්ධ) .. | — 46 | — 676 | — 733 |
| 3·3 රාජ්‍ය අංශය .. .. | + 541 | — 676 | — 1,520 |
| 3·3·1 වෙළඳ බැංකු ණය .. | + 367 | + 132 | — 113 |
| 3·3·2 මහ බැංකු ණය .. | + 363 | — 187 | + 38 |
| 3·3·3 බැංකු තැන්පතු සහ මුදල් ශේෂ .. | — 273 | — 223 | — 1,050† |
| 3·3·4 මහ බැංකුවේ අනෙකුත් වත්කම් සහ වගකීම් (ශුද්ධ) . | + 83 | — 398 | — 304 |
| 3·4 භුවමාරු වෙමින් පවත්නා ශීර්ෂ .. | — 3 | + 4 | — 121 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

† සලකුණු වලින් මුදල් සැපයුම කෙරෙහි වූ බලපෑම දැක්වේ.

* විනිමය අනුපාතිකයේ වෙනස්වීම් නිසා බැංකු විදේශීය වත්කම්හි ඇතිවන වෙනස්වීම් මහ බැංකුවේ අනෙකුත් වත්කම් සහ ගිණුම් (ශුද්ධ) වල ප්‍රතිසටහන් වී ඇති නිසා මෙම විශ්ලේෂණයෙන් එය ඉවත් කර ඇත. 1977 සහ 1978 සම්බන්ධයෙන් වන එකී වෙනස්වීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ + 1,655 ක් සහ රුපියල් දශ ලක්ෂ + 361 ක් විය. + ජාතික සංවර්ධන බැංකුව සඳහා, රජය විසින් මහ බැංකුවට මාරු කරන ලද රුපියල් දශලක්ෂ 390 ක ප්‍රමාණයක්ද ඇතුළත් වේ.


රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතන ඇතුළු පෞද්ගලික අංශයේ ගණුදෙනු මගින් 1977 දී වූ රුපියල් දශලක්ෂ 70 ක සංකෝචනාත්මක බලපෑමකට හාත්පසින් ප්‍රතිවිරුද්ධව, 1978 වර්ෂයේදී මෙම අංශයේ කටයුතු මගින් මුදල් සැපයුම මත රුපියල් දශලක්ෂ 688 ක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති විය. මෙයට දයක වූ ප්‍රධානතම සාධකය වූයේ මෙම අංශයට දෙන ලද වෙළඳ බැංකු ණය රුපියල් දශලක්ෂ 3,026 කින් තියුණු ලෙස වැඩිවීමය. වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනුකරුවන්ට දෙන ලද බැංකු ණයෙහි රුපියල් දශලක්ෂ 1,890 ක වාර්තාගත වැඩිවීමක් සිදුවූ අතර, රාජ්‍ය සංස්ථාවන්ට හා සමුපකාර ආයතනයන්ට දෙන ලද ණය, පිළිවෙලින් රුපියල් දශලක්ෂ 693 කින් සහ රුපියල් දශලක්ෂ 443 කින් ඉහළ නැගුණි. මේ අනුව, ඉකුත් වසර තුලදී මුදල් සැපයුම මත සංකෝචනාත්මක බලපෑමක් ඇතිකළ අනෙකුත් පෞද්ගලික අංශය එම තත්ත්වයට ප්‍රතිවිරුද්ධව 1978 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 539 ක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේය. මෙවැන්නක් සිදු වූයේ එම අංශය සතු කාලීන හා ඉතුරුම් තැන්පතුවල රුපියල් දශලක්ෂ 1,351 ක සැලකිය යුතු වැඩිවීමක් තිබියදීත්ය. මෙම අංශයට දෙන ලද බැංකු ණයවල තියුණු වැඩිවීම, 1977 නොවැම්බර් මාසයේදී වූ ආර්ථික ප්‍රතිපත්තියෙහි නව හැඩගැස්ම හේතුකොටගෙන ඇති වූ ණය අවශ්‍යතාවයන් වැඩිවීම මගින් පැහැදිලි කෙරේ.

1978 දී රාජ්‍ය සංස්ථාවන්හි ණය කටයුතු රුපියල් දශලක්ෂ 493 ක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කිරීමට හේතු විය. මෙය, වෙළඳ බැංකු වෙතින් වූ ණය ගැන්මෙහි රුපියල් දශලක්ෂ 693 ක වැඩිවීමක සහ එය තරමක් දුරට සමහන් කළ කාලීන හා ඉතුරුම් තැන්පත්හි රුපියල් දශලක්ෂ 200 ක වැඩිවීමක ප්‍රතිඵලයක් විය. 1978 වර්ෂය තුළදී මෙම සංස්ථාවන්ට දෙන ලද බැංකු ණයවල වැඩිවීම එක් වර්ෂයක් සඳහා මෙතෙක් වාර්තා වූ ඉහලම වැඩිවීම විය. මෙම වැඩිවීමෙන් විශාලතම ප්‍රමාණයක් හට ගැනුනේ වසරේ ප්‍රථම භාගයේදීය. වර්ෂයේ දෙවන භාගය තුළදී වූ රුපියල් දශලක්ෂ 154 ක වැඩිවීමක් හා සසඳන කල මුල් භාගයේදී වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 539 ක් විය. ණය ගැනීම අඩුවීම කෙරෙහි, එම කාලය තුළ බලපැවැත්වූ ණය සීමාවන්ගෙන් ඇතිවූ සීමාකාරී බලපෑම් තරමක් දුරට හේතුවන්නට ඇත. රාජ්‍ය සංස්ථාවන් වෙළඳ බැංකු මත යැපීම වැඩිවීම, ආනයන නිදහස් කරණය නිසා ආනයන ගෙවීම් ඉහල යාම හා ඇතැම් සංස්ථාවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන් වැඩිවීම යන කරුණු මගින් තරමක් දුරට පැහැදිලි කළ හැක.

ඉකුත් වසරේදී රුපියල් දශලක්ෂ 568 ක වාර්තාගත වැඩිවීමක් පෙන්නුම් කළ සමුපකාර ආයතනයන්ට දෙන ලද වෙළඳ බැංකු ණය 1978 දී තවදුරටත් රුපියල් දශලක්ෂ 443 කින් වැඩි විය පසුගිය වසරේදී මෙන්ම, මෙම වැඩිවීමෙන් විශාල කොටසක්, එනම්; රුපියල් දශලක්ෂ 349 ක් සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම් සඳහා දෙන ලද අත්තිකාරම විය. එහෙත්, මෙම වැඩිවීම විශාල වශයෙන් සංඛ්‍යාත්මකව වූ වැඩිවීමක් මිස නියම තත්ත්වය පිළිබිඹු කරන්නක් නොවේ. මෙයට හේතු වූයේ, දෙසැම්බර් මාසය අවසාන වන විට, කල්පිරුණු භාණ්ඩ කුවිතාන්සි පියවා දමන තෙක් වී අලෙවි මණ්ඩලය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 297 ක් බැංකු ක්‍රමය විසින් අවිනිශ්චිතව පවත්වා ගැනීමයි. මෙම ප්‍රමාණය සඳහා ඉඩහල විට වර්ෂය තුළදී සහතික මිළ ක්‍රමය යටතේ දෙන ලද අත්තිකාරම්වල ශුද්ධ වැඩිවීම ඇත්තෙන්ම ඉතා සුළුය. කෙසේ වුවද, සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගැනීම් සඳහා මූල්‍ය පහසුකම් සම්බන්ධයෙන් වූ දියුණුව ඇති වූයේ තොග රැස්කිරීම හා කල් පිරෙමින් පවත්නා භාණ්ඩ කුවිතාන්සි පියවීම සඳහා 1978 අවසාන කාර්තුවේදී භාණ්ඩාගාරය විසින් රුපියල් දශලක්ෂ 340 ක් වී අලෙවි මණ්ඩලයට පවරාදීම නිසාය. වගා ණය සහ අනෙකුත් ණයද වර්ෂය තුළදී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 49 කින් හා රුපියල් දශලක්ෂ 45 කින් ැඩි විය. මෙම අංශය විසින් ප්‍රයෝජනයට ගත් බැංකු ණය ප්‍රමාණය මැඩපවත්වන අන්දමේ බලපෑමක් ඇති කළ තවත් වැදගත් ප්‍රතිපත්තිමය තීරණයක් වූයේ 1978 ඔක්තෝබර් මස සිට බල පැවැත්වෙන පරිදි නොගෙවා පැහැර හරින ලද ණය සම්බන්ධයෙන් පැවති සියයට 75 ක් දක්වා වූ ඇපවීම ඉවත් කිරීමය.

## මුදල් සැපයුම

1966 – 73 වර්ෂාවසාන  1974 ජනවාරි සිට මාසාවසාන





ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

''රජයේ සහ වෙළඳ බැංකු හැර පුද්ගලයන් සතු සියලු ව්‍යවහාර මුදල් (නෝට්ටු සහ කාසි) සහ ඉල්ලුම් තැන්පතු'' වශයෙන් මුදල් සැපයුම අර්ථ නිරූපනය කර ඇත.

# මුදල් සැපයුමේ මූලාශ්‍ර

1966 73 වර්ෂාවසාන: 1974 ජනවාරි සිට මාසාවසාන




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමේ මූලාශ්‍ර මෙම සටහන මගින් පෙන්නුම් කෙරේ.

(අ) "රජයේ මුදල් පරිහරණය" :— බැංකු ක්‍රමය මගින් රජයට දී ඇති ණය ප්‍රමාණය (රජය සතු රුපියල් මුදල් හැර).

(ආ) "මහජනයාට දුන් ණය" :— වෙළෙඳ බැංකු විසින් පෞද්ගලික අංශයට දී ඇති ණය ප්‍රමාණය (කාලීන හා ඉතුරුම් තැන්පතු හැර).

ශුද්ධ විදේශීය බැංකු වත්කම සෘණ අගයක් ගන්නා විට මුළු මුදල් සැපයුම දක්වෙන රේඛාව රජයේ මුදල් පරිහරණය සීමා කෙරෙන රේඛාවට පහලින් සිටී. රජයේ දයකත්වය සෘණ අගයක් ගන්නා විට මුළු මුදල් සැපයුම් රේඛාව මහජනයාට දුන් ණය සීමා කෙරෙන රේඛාවට පහලින් සිටී.

ජාත්‍යන්තර සංචිත ප්‍රති ඇගයීම් ගිණුමෙහි ප්‍රති සටහන් සහිත, විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් වලට අදළ බැංකු විදේශීය වත්කම් වල වූ වෙනස්වීම් 1971 ජනවාරි මාසයේ සිට ඉවත් කර ඇත.

විදේශීය අංශයේ හා පෞද්ගලික අංශයේ පැවති වර්ධනයන්ට හාත්පසින් ප්‍රතිවිරුද්ධව 1978 දී රාජ්‍ය අංශයේ කටයුතු මුදල් සැපයුම මත සැලකිය යුතු සංකෝචනාත්මක බලපෑමක් ඇති කළේය. සමස්තයක් වශයෙන්, මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ)හි වෙනස්වීම ඇතුලුව බැංකු ක්‍රමය සමග වූ රජයේ මූල්‍ය කටයුතු මගින් මුදල් සැපයුම මත රුපියල් දශලක්ෂ 1,520 ක සංකෝචනාත්මක බලපෑමක් ඇති විය. මුදල් සැපයුම මත රජයේ මූල්‍ය කටයුතු මගින් සැලකිය යුතු සංකෝචනාත්මක බලපෑමක් ඇති කළ පිළිවෙලින් දෙවන වර්ෂය මෙය විය. මෙම සංකෝචනාත්මක බලපෑම බැංකු ක්‍රමය වෙතැති රජයේ තැන්පතු වැඩිවීමක හා ඊට අඩු ප්‍රමාණයකින් බැංකු ණය අඩුවීමක සංයුක්ත ප්‍රතිඵලයක් විය. වර්ෂය තුළදී බැංකු ක්‍රමය වෙතැති රජයේ තැන්පතුවල රුපියල් දශලක්ෂ 1,050 ක වාර්තාගත වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. කෙසේවුවද, ජාතික සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධනය සඳහා රජයේ දායකත්වය වශයෙන් මහ බැංකුවේ තැන්පත් කළ රුපියල් දශලක්ෂ 390 ක් ද මෙහි ඇතුළත්ය. වර්ෂය තුළදී රජයට දෙන ලද වෙළඳ බැංකු ණය රුපියල් දශලක්ෂ 113 කින් පහත වැටුණු අතර, මහ බැංකුවෙන් දෙන ලද ණය රුපියල් දශලක්ෂ 38 කින් වැඩිවිය. ඒ අනුව, රජයට දෙන ලද බැංකු ණයවල ශුද්ධ අඩුවීම රුපියල් දශලක්ෂ 75 කි. මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ)හි රුපියල් දශලක්ෂ 394 ක වැඩිවීමත් සමග, ඉහත කී ගණුදෙනු නිසා වර්ෂය තුළදී රාජ්‍ය අංශය මගින් මුදල් සැපයුම මත හටගත් සමස්ත සංකෝචනාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 1,520 ක් විය.

සාරාංශ වශයෙන් ගත් කල, 1978 මූල්‍ය ප්‍රාසාරණයට හේතු වූ ප්‍රධානතම සාධකයන් වූයේ බැංකු විදේශීය වත්කම්වල සැලකිය යුතු වැඩිවීමත්, පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණයවල වාර්තාගත වැඩිවීමත්ය. කෙසේවුවද, රාජ්‍ය අංශයෙන් හටගත් සංකෝචනාත්මක බලපෑම හා බැංකු නොවන පෞද්ගලික අංශයේ කාලීන හා ඉතුරුම් තැන්පතුවල සැලකිය යුතු වර්ධනය වර්ෂය තුළදී වූ මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය අඩු කිරීමට හේතු විය. මෙම වාසිදායක සංවර්ධනයන් සිදු නොවන්නට, මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ අපේක්ෂිත පසුබෑම තවදුරටත් කල් පමාවනු ඇත. කෙසේවුවද, මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ මෙම පසුබෑම සිදුවීමට පෙර හටගත් මූල්‍ය ප්‍රසාරණය හේතුකොටගෙන වර්ෂය මුළුල්ලේදීම මිල මට්ටම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති විය. ආනයන නිදහස් කිරීමෙන් පසු රට තුළට ආනයන ගලා ඒම නිසා එහි බලපෑම තරමක් දුරට අඩු විය.

වෙළඳ බැංකු කටයුතු

පිළිවෙලින් නොකඩවා තෙවන වසරටත් 1978 දී ද වෙළඳ බැංකු සම්පත්වල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. 1976 හා 1977 දී පිළිවෙලින් වූ සියයට 24 ක හා සියයට 56 ක වැඩිවීම් හා සසඳන කල, මෙම වර්ෂය තුළදී මුළු සම්පත් වල වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 3,585 ක් හෙවත් සියයට 35 ක් විය. මෑත වර්ෂයන්හි දක්නට ලැබුන අයුරින් 1978 දී ද සම්පත් වල වර්ධනයට හේතුවූ ප්‍රධානතම සාධකය වූයේ තැන්පතුවල වැඩිවීමයි. තැන්පතුවල වූ මෙම වැඩිවීමෙන් විශාලතම කොටසක් කාලීන හා ඉතුරුම් තැන්පතු නිසා සිදුවිය. මෙය, 1977 පොලී අනුපාතික සංශෝධනයෙන් පසුව, බැංකු ක්‍රමය තුලට ගලා ආ කාලීන හා ඉතුරුම් තැන්පතුවල තියුණු වැඩිවීමෙන් වූ වාසිදායක සංවර්ධනය නොකඩවා පැවතීමකි. මෙම සම්පත් වැඩිවීම, ගෙවා නිමි ප්‍රාග්ධනය, සංචිත අරමුදල් හා නොබෙදූ ලාභ, අන්තර් බැංකු හා විදේශීය ණය ගැනීම් සහ අනෙකුත් වගකීම්වල වූ වැඩිවීම් මගින් තවදුරටත් ඉහළ නැගුණි. සම්පත්වල සිදුවූ මෙම සැලකිය යුතු වැඩිවීමත් සමග, ඊටත් වඩා වැඩි ණය ඉල්ලුමක් බැංකු නොවන පෞද්ගලික අංශයෙන් ඇතිවිය. සමස්ත වශයෙන්, බැංකු නොවන පෞද්ගලික අංශයට දෙන ලද වෙළඳ බැංකු ණය වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 3,026 ක වාර්තාගත වැඩිවීමක් පෙන්වූ අතර, මේ නිසා මුළු තැන්පතුවලට වූ ණය මුදල් හා අයිරාවන්හි අනුපාතය 1977 දී පැවති සියයට 69 සිට 1978 දී සියයට 80 දක්වා ඉහළ නැගීමක් සිදුවිය. මේ අනුව, සම්පත්වල විශාල එක් රැස්වීමක් තිබියදීත්, 1978 අවසාන වනවිට වෙළඳ බැංකු ද්‍රවශීලතාවයෙහි සෑහෙන අඩුවීමක් ඇතිවුනි. මෙය ද්‍රවශීලතා අනුපාතයන් මගින් බෙහෙවින් පිළිබිඹු කෙරෙන අතර

ඉල්ලුම් තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 88 සිට සියයට 85 දක්වාද, මුළු තැන්පතු වලට වූ ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 44 සිට සියයට 37 දක්වාද පහත වැටීමෙන් මෙය වඩාත් පැහැදිලිව පෙන්නුම් කෙරේ. තවද, 1977 අවසානයේදී බැංකු පොලී අනුපාතිකය (දණ්ඩන පොලී අනුපාතිකය ඇතුළු) යටතේ වෙළඳ බැංකු විසින් මහ බැංකුවෙන් ලබාගත් ණය ප්‍රමාණය සැලකිය යුතු නොවන අන්දමේ ඉතා සුළු ප්‍රමාණයක්ව පැවතියද එය 1978 අවසානය වනවිට රුපියල් දශලක්ෂ 255 ක් තරම් විය.

ඉහත දී සඳහන් කළ පරිදි 1978 දී වෙළඳ බැංකු සම්පත් රුපියල් දශලක්ෂ 3,585 කින් වැඩි විය. වැඩි වූ මෙම සම්පත් ''අනෙකුත් දේශීය පෞද්ගලික අංශය'' රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතනයන්ට ණය පහසුකම් සැපයීම සඳහාද, අන්තර් බැංකු ගනුදෙනු මූල්‍ය කරනය සඳහාද ප්‍රයෝජනයට ගනු ලැබිණි. සමස්ත වශයෙන්, ''අනෙකුත් පෞද්ගලික අංශයට'' දෙන ලද වෙළඳ බැංකු ණය රුපියල් දශලක්ෂ 1,890 කින් වැඩිවිය. කෙසේ වුවද, බැංකු ක්‍රමය වෙතැති මෙම අංශයේ තැන්පතු රුපියල් දශලක්ෂ 1,540 කින් වැඩිවීම හේතු කොට ගෙන, මෙම අංශයට වූ ශුද්ධ සම්පත් ගලා යාම රුපියල් දශලක්ෂ 350 කට සීමාවිය. මෙම අංශය විසින් සම්පත් විශාල ලෙස ප්‍රයෝජනයට ගැනීම මගින් නව ආර්ථික ප්‍රතිපත්තින් නිසා මෙම අංශයේ කටයුතුවල ඇතිවූ උසස් තත්ත්වය පිළිබිඹු වේ. රාජ්‍ය සංස්ථාවන් විසින් වෙළඳ බැංකු වෙතින් ලබාගත් ණය රුපියල් දශලක්ෂ 693 කින් වැඩි වුවද, සංස්ථාවන් සතු වෙළඳ බැංකු වෙතැති තැන්පතු රුපියල් දශලක්ෂ 411 කින් වැඩිවීම නිසා සංස්ථාවන් ලබාගත් ශුද්ධ සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 282 දක්වා අඩුවිය. සමුපකාර ආයතනයන් විසින්ද සම්පත් විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත් අතර, වර්ෂය තුළදී ඒවායේ වූ ශුද්ධ වැඩිවීම රුපියල් දශලක්ෂ 452 ක් විය. බැංකු ක්‍රමය තුළ සම්පත් උපයෝගී කරණය රුපියල් දශලක්ෂ 467 ක් වූ අතර මෙය ප්‍රධාන වශයෙන් ස්ථාවර හා අනෙකුත් වත්කම් සහ කැටමුදල් වල වැඩිවීම් ස්වරූපයෙන් සිදුවිය. 1—17 වන සංඛ්‍යා සටහනින් ශුද්ධ පදනමක් මත වෙළඳ බැංකු සම්පත් හා ඒවායේ උපයෝගීකරණය සාරාංශ කොට දක්වා ඇත.

1·17 වැනි සංඛ්‍යා සටහන

වෙළඳ බැංකු සම්පත් සහ ඒවායේ උපයෝගීකරණය


රුපියල් දශලක්ෂ

| අංශ | 1975/1976 අග | 1976/1977 අග | 1977/1978 අග |
|---|---|---|---|
| 1· රජය .. .. | — 104·9 | 25·6 | 220·8 |
| 2 මහ බැංකුව .. .. | — 251·2 | 197·6 | 126·1 |
| 3· රාජ්‍ය සංස්ථා .. .. | 182·8 | — 197·3 | — 282·0 |
| 4· සමුපකාර ආයතන .. .. | — 27·7 | — 474·9 | — 451·8 |
| 5· අනෙකුත් පෞද්ගලික අංශය .. | 332·2 | 546·1 | — 350·5 |
| 6· අන්තර් බැංකු .. .. | 34·3 | 541·0 | 722·3 |
| 7· විදේශීය අංශය .. .. | — 165·0 | — 637·7 | 15·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

බැංකු ශාඛා ව්‍යාප්තිය

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී වෙළඳ බැංකු මුළු ශාඛා කාර්යාල ගණන 22 කින් වැඩිවිය. මේ හා සසඳන කල, ඉකුත් වසරේ වූ වැඩිවීම 76 කි. මෙම නව ශාඛා කාර්යාල විවෘත කිරීම මුළුමනින්ම ලාංකික බැංකු සම්බන්ධයෙන් වූ අතර එය රාජ්‍ය බැංකු දෙක අතර සමානව බෙදී ගියේය. ලංකා බැංකුව වර්ෂය තුළදී නව පූර්ණ ශාඛා කාර්යාල 11 ක් විවෘත කළෙන් 1978 අවසාන වන විට එම බැංකුවට අයත් මුළු පූර්ණ ශාඛා කාර්යාල ගණන 90 ක් විය. වර්ෂය තුළදී කෘෂි සේවා මධ්‍යස්ථාන කිසිවක් විවෘත නොකළෙන් එම මධ්‍යස්ථාන ගණන 390 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. මේ අනුව, 1978 අවසානය වනවිට ලංකා බැංකුවේ මුළු ශාඛා කාර්යාල ගණන 480 ක් විය. මහජන බැංකුව, 1978 අවසානය වනවිට තම ශාඛා කාර්යාල ගණන 216 දක්වා වැඩි කරමින් වර්ෂය තුළදී නව ශාඛා කාර්යාල 11 ක් විවෘත කලේය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව, තම ශාඛා කාර්යාල ගණන 27 දක්වා වැඩි කරමින් වර්ෂය තුළදී නව ශාඛා කාර්යාල දෙකක් කොළඹ දිස්ත්‍රික්කයෙහි විවෘත කරනු ලැබීය.

1977 වාර්ෂික වාර්තාවෙන් මෑත වර්ෂයන්හිදී බැංකු ශාඛා ව්‍යාප්තියෙහි වූ සීඝ්‍ර වර්ධනය සම්බන්ධයෙන් පැනනැඟුණු ප්‍රශ්න කිහිපයක් පිළිබඳව සැලකිල්ල යොමු කරවන ලදී. ඈත ග්‍රාමීය ප්‍රදේශයන්හි බැංකු ශාඛා පිහිටුවීම නිසා ඇතිවූ ආරක්ෂිතභාවය පිළිබඳ ප්‍රශ්නය, මේවා අතර වූ එක් ප්‍රශ්නයකි. 1978 වර්ෂය තුළදී කුඩා ශාඛා කාර්යාල කිහිපයක්ම කොල්ලකෑම නිසා එම ප්‍රශ්නය උග්‍රවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරක්ෂක කටයුතු දැඩි කිරීම සඳහා උතුරු පළාතට අයත් වූ ශාඛා කාර්යාල 97 ක (මින් 81 ක් කෘෂි සේවා මධ්‍යස්ථානයන් විය.) ව්‍යාපාරික කටයුතු ඊට සමීප නගරවලට මාරුකිරීමක් මගින් ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව එකී කාර්යාල වල ව්‍යාපාරික කටයුතු තාවකාලිකව අත්හිටවනු ලැබීය.

පොලී අනුපාතික

පසුගිය වසරේ වාර්ෂික වර්තාවෙහි සඳහන් කල පරිදි "ආර්ථිකය පුරාම පැතිර ගිය උද්ධමනකාරී පීඩනයන් පැවති පසුබිමක පොලී අනුපාතිකයන් සැලකිය යුතු ඉහල මට්ටමකට නංවමින් 1977 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පොලී අනුපාතික ප්‍රතිපත්තියෙහි මූලික වෙනස් වීමක් සිදුවිය." මේවා අතර වැදගත් සිද්ධීන් වූයේ බැංකු පොලී අනුපාතිකය වැඩිකිරීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (ජා.ඉ.බැ.) කාලීන තැන්පතු සඳහා වූ පොලී අනුපාතිකයන් තියුණු ලෙස වැඩි කිරීම හා ඊට අනුරූපව වෙළඳ බැංකුවල තැන්පතු අනුපාතිකයන් ගේ වූ වෙනස්වීම, භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය හා අන්තර්-බැංකු ඒක්ෂණ ණය සඳහා වූ පොලී අනුපාතිකය ඉහල යාම, වෙළඳ බැංකුවල ණයදීමේ පොලී අනුපාතිකයන්හි වූ සැලකිය යුතු වැඩිවීම සහ දිගු කාලීන ණය දෙන ආයතනයන්ගේ ණය දීමේ පොලී අනුපාතිකයන් බොහෝ දුරට නොවෙනස්ව පැවතීමත්ය.

1978 වර්ෂය තුළදී පොලී අනුපාතික මට්ටමේ හෝ එහි ව්‍යුහයේ කැපී පෙනෙන වෙනස්වීම් ඇති නොවීය. බැංකු පොලී අනුපාතිකය සහ භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය පිළිවෙලින් සියයට 10 සහ සියයට 9 වශයෙන් නොවෙනස්ව පැවතුනි. වෙළඳ බැංකුවල කාලීන හා ඉතුරුම් තැන්පතු වෙනුවෙන් වූ පොලී අනුපාතිකයන්හිත්, ණය මුදල් සහ අත්තිකාරම් වෙනුවෙන් අයකල පොලී අනුපාතිකයන්හිත් වෙනසක් සිදු නොවූ තරමය. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාලීන සහ ඉතුරුම් තැන්පතු පොලී අනුපාතිකයන්ද, වර්ෂය තුළදී බොහෝ දුරට නොවෙනස්ව පැවතුනි. නමුත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවත්නා පහසුකම්වල සුළු වෙනස්කිරීම් සමහරක් වර්ෂය තුළදී හඳුන්වා දෙන ලදී. මෙම වෙනස්කම් වූයේ 1978 ජුලි 02 දින සිට එක් අවුරුද්දක් සඳහා වූ කාලීන තැන්පතු වර්ෂයකට සියයට 14·4 ක මාසික පොලියක් ගෙවීමත්, 1978 ඔක්තෝබර් 1 දින සිට මාස 18 ක් සඳහා වූ කාලීන තැන්පතුවලට සියයට 16·8 ක මාසික පොලියක් ගෙවීමත්, රුපියල් 5,000 ක අවම තැන්පත් මුදලකට යටත්ව එදිනම සිට රුපියල් 100,000 ඉක්මවන එක් අවුරුදු තැන්පතු සඳහාවූ පොලී අනුපාතිකය සියයට 15 දක්වා වැඩි

කිරීමත්ය. තවද, 1978 ජුලි 2 දින සිට බලපාන පරිදි, කල්පිරීමට පෙර ආපසු හැරගන්නා නව කාලීන තැන්පතු සඳහා අඩු පොලී ප්‍රමාණයන් ගෙවීමටත් තීරණය කරන ලදී. කල් නොපිරුණු ස්ථාවර තැන්පතු ආපසු ගැනීමේදී කිසිදු පොලියක් ඒ වනතෙක් නොගෙවන ලදී. 1978 වර්ෂය තුළදී රාජ්‍ය උකස් බැංකුවේත්, සංවර්ධන මූල්‍ය සමායතනයේ සහ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේත් ණයදීමේ පොලී අනුපාතිකයන් නොවෙනස්ව පැවතුණි. මහ බැංකුවේ මැදි සහ දිගුකාලීන ණය අරමුදලේ ණය දීමේ පොලී අනුපාතිකයන්හිද වෙනස්වීම් සිදු නොවීය. 1977 නොවැම්බර් මාසයේදී සියයට 3 ක වැඩිවීමක් වාර්තා වූ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ ණයදීමේ පොලී අනුපාතිකය 1978 ජුනි මාසයේදී සියයට එකකින් සුළු වශයෙන් අඩුවිය. ණය දීමේ අනුපාතිකයන්හි දක්නට ලැබුණු තවත් වෙනසක් වූයේ 1978 මැයි මාසයේ සිට ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් තැනිම් කටයුතු සහ අනෙකුත් ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතිකය සියයට එකකින් වැඩි කිරීමයි. 1977 සැප්තැම්බර් මාසයේදී සියයට 9 සිට සියයට 10 දක්වා වැඩිවූ රජයේ පිළිණපත් (අවු. 10 – 12 වූ පිළිණපත්) අනුපාතිකයද වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි. අන්තර් බැංකු ඒක්ෂණ ණය සඳහාවූ පොලී අනුපාතිකයේද කිසිදු වෙනස්වීමක් වාර්තා නොවූ නමුදු, ඒ වනවිට පැවති පොලී අනුපාතිකය සියයට 9.5 ක උපරිමය දක්වා ලඟාවන අයුරින්, වසරේ ද්විතිය භාගය තුළදී මෙම වෙළඳ පොලෙහි වැඩි පීඩනයක් ඇතිවන ලකුණු දක්නට ලැබුණි.

වෙළඳ බැංකුවල ණය දීමේ පොලී අනුපාතිකයන් වසර මුළුල්ලෙහිම ඉහළ මට්ටමක පැවතුනු නමුදු, පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම් කෙරෙහි අනවශ්‍ය බාධාවීම් සිදුවූ බවට සාක්ෂි නොමැත. ඒ අනුව, 1978 දී පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණයවල වාර්තාගත වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ණය සඳහා වූ ඉල්ලුම කෙරෙහි ඉහළ පොලී අනුපාතිකයන් මගින් අහිතකර බලපෑම් සිදුවූවා නම්, එම බලපෑම්, ආනයන නිදහස්කරණය හා දියුණු වන ව්‍යාපාරික වාතාවරණයක් වැනි අනෙකුත් වාසිදයක සාධක මගින් මුළුමනින්ම අභිබවා ඇති බව සඳහන් කළහැකිය.

1977 පොලී අනුපාතික ප්‍රතිශෝධනය අනුව සිදුවූ සැලකිය යුතු වර්ධනයක් වූයේ ආයතනික ස්වරූපයෙන් තැන්පතු රාශිකරණයෙහි හටගත් තියුණු වැඩිවීමකි. 1977 මුල් මාස 8 තුළදීවූ රුපියල් දශලක්ෂ 613 ක හා 1976 වර්ෂයේදී වූ රුපියල් දශලක්ෂ 466 ක වැඩිවීමක් හා සසඳා බලන කල 1977 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ සිව් මසක කාලය තුළදී වෙළඳ බැංකු වෙනැති බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු කාලීන හා ඉතුරුම් තැන්පතු රුපියල් දශලක්ෂ 513 කින් වැඩිවිය. 1978 දී ද වෙළඳ බැංකුවල තැන්පතු රැස්කිරීමේ වේගය නොකඩවා පැවතුනු අතර, වසර අවසානය වනවිට ඒවායේ මුළු එකතුව රුපියල් දශලක්ෂ 1,572 ක් විය. තැන්පතු රාශිකරණයෙහි වූ මෙම සාර්ථකත්වය වර්ෂය තුලදී සිදුවූ මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ පසුබෑම ඇතිකර ගැනීමට ඉවහල් වූ ඉතා වැදගත් සාධකයක් විය.

## මහ බැංකු කටයුතු

පසුගිය වසරේ රුපියල් දශලක්ෂ 4,963 කින් හෙවත් සියයට 76 කින් අනපේක්ෂිත ලෙස වැඩිවූ මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් 1978 වර්ෂයේදී තවදුරටත් රුපියල් දශලක්ෂ 2,711 කින් හෙවත් සියයට 23 කින් වැඩිවිය. පසුගිය වර්ෂයේදී මෙන්ම මෙම වැඩිවීම වැඩි වශයෙන් දක්නට ලැබුනේ විදේශීය වත්කම් වලිනි. සමස්ත වශයෙන්, මහ බැංකුවේ විදේශීය වත්කම් (ජාත්‍යන්තර සංචිත) රුපියල් දශලක්ෂ 1,806 කින් වැඩිවූ අතර, දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 905 කින් වැඩිවිය. වර්ෂය තුලදී වූ ජාත්‍යන්තර සංචිතයේ වැඩිවීමෙන් විශාල කොටසක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වූ ගණුදෙනු නිසා සිදුවිය. වර්ෂය තුලදී ශුද්ධ වශයෙන් රුපියල් දශලක්ෂ 348 ක හැර ගැනීමක් වූ අතර භාරකාර ණය අරමුදල මගින් රුපියල් දශලක්ෂ 778 ක්ද ලැබුණි. මේ හා සමග වූ දිගුකාලීන ප්‍රාග්ධන ගලා ඒම නිසා ගෙවුම් තුලනයේ ජංගම ගිණුමෙහි හිඟය ඉක්මවමින් වර්ෂය තුලදී බැංකුවේ විදේශීය වත්කම්වල සැලකියයුතු වැඩිවීමක් සිදුවිය

1978 වර්ෂයේදී මහ බැංකුවේ දේශීය වත්කම්වල වර්ධනයට හේතුවූ ප්‍රධාන සාධකයන් වූයේ 'අනෙකුත් වත්කම් හා ගිණුම්වල' වූ වැඩිවීමත්, වෙළෙඳ බැංකුවලට දෙනලද අත්තිකාරම්හි වැඩිවීමත් ය. සමස්ත වශයෙන්, 1978 වර්ෂය තුලදී අනෙකුත් වත්කම් හා ගිණුම් රුපියල් දශලක්ෂ 676 කින් වැඩිවිය. අනෙකුත් වත්කම්වල වැඩිවීමට දායක වූ ප්‍රධාන

සාධකයන් වූයේ ආසියානු නිශ්කාෂන සංගමය* යටතේ වූ හිමිකම් පැමිනි රුපියල් දශලක්ෂ 264 ක වැඩිවීමත්, රජය වෙනුවෙන් නිකුත් කළ සහතිකකිරීම්හි වටිනාකම රුපියල් දශලක්ෂ 267 කින් වැඩිවීමත්ය. වර්ෂය තුල සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කල අනෙකුත් ශීර්ෂයන් අතර රජයට දුන් තාවකාලික අත්තිකාරම්වල රුපියල් දශලක්ෂ 412 ක වැඩිවීමක් විය. මේ හා සසඳන විට බැංකුව සතු රජයේ සහ රජය සහතික කළ සුරකුම්පත් දැරීම් රුපියල් දශලක්ෂ 300 කින් අඩුවූ අතර රජයට දුන් විශේෂ ණය රුපියල් දශලක්ෂ 73 කින් අඩුවිය. මේ නිසා මහ බැංකුව මගින් රජයට දුන් ණයෙහි ශුද්ධ වැඩිවීම රුපියල් දශලක්ෂ 38 ක් විය. ඉකුත් වසරේ දී රුපියල් දශලක්ෂ 496 කින් තියුණු ලෙස වැඩිවූ වෙළඳ බැංකුවලට දෙනලද මහ බැංකු ණය 1978 වර්ෂයේදී තවදුරටත් රුපියල් දශලක්ෂ 191 කින් වැඩිවිය.

විශාල වශයෙන් විදේශීය වත්කම්වල ඉහළ යාමක් නිසා වර්ධනය වූ මහ බැංකු වත්කම් වලට වඩා හාත්පසින්ම වෙනස්ව මහ බැංකුවේ වගකීම් මුළුමනින්ම දේශීය වගකීම්වල වැඩිවීමක් නිසා සිදුවිය. පසුගිය වසරේදී මෙන්ම 1978 වර්ෂය තුලදී ද දේශීය වත්කම්වල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ 'අනෙකුත් වගකීම්' ය. 1977 දී රුපියල් දශලක්ෂ 3,084 කින් වැඩි වූ මෙම 'අනෙකුත් වගකීම්' 1978 දී තවදුරටත් රුපියල් දශලක්ෂ 1,344 කින් වැඩිවිය. මෙම වැඩිවීමට හේතුවූ ප්‍රධාන සාධකයන් වූයේ විශේෂ හැර ගැනුම් අයිතිවාසිකම් සඳහා වෙන්කිරීම් (රුපියල් දශලක්ෂ 375) සහ 'අනෙකුත් වත්කම්' යටතේ ප්‍රති සටහනක් ඇති රජය වෙනුවෙන් නිකුත් කළ ඇපවීම් හි වටිනාකමේ වූ වැඩිවීමය. (රුපියල් දශලක්ෂ 276) 'අනෙකුත් වගකීම්' හැරුන විට 1978 වර්ෂයේදී තැන්පතුවල විශාල වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමස්ත වශයෙන්, මහ බැංකුවේ තැන්පතු දැරීම් වර්ෂය තුලදී රුපියල් දශලක්ෂ 1,473 කින් වැඩි විය. මෙය විශාල වශයෙන් පිළිබිඹු වූයේ රුපියල් දශලක්ෂ 944 කින් වැඩි වූ රජයේ තැන්පතු මගිනි. ඉකුත් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 812 ක වැඩිවීමක් වාර්තා කළ බැංකුවේ ව්‍යවහාර මුදල්නිකුතුව 1978වර්ෂයේදී රුපියල් දශලක්ෂ 289 කින් වැඩි විය. ව්‍යවහාර මුදල් නිකුතුව මෙලෙස සැලකිය යුතු ලෙස අඩු වේගයකින් වැඩිවීම, වර්ෂය තුල දී අත්දුටු මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ වූ සැලකිය යුතු පසුබෑමේ, පිළිබිඹුවකි.

1978 වර්ෂයේදී මහ බැංකු වගකීම් වෙනස්වීමෙහි වූ තවත් වැදගත් ලක්ෂණයක් වූයේ විදේශීය වගකීම්වල වූ රුපියල් දශක්ෂ 85 ක ශුද්ධ අඩුවීමයි. බැංකුවේ විදේශීය වත්කම්වල වූ තියුණු වැඩිවීම හා සසඳා බලනකල, විදේශීය වගකීම්වල වූ මෙම අඩුවීම සුළු වුවද, එමගින් වර්ෂය තුලදී ශක්තිමත් වූ රටේ ගෙවුම් තුලන තත්ත්වය වඩාත් ස්ථාවර විය. සමස්ත වශයෙන් 1978 වර්ෂයේ මහ බැංකුවේ වත්කම් හා වගකීම් වර්ධනය වූ ආකාරය බලන විට, වත්කම්වල වැඩිවීමෙන් සුළු කොට සක් පමණක් බැංකුවට අයත්වූ වගකීම් වෙනුවෙන් ලබාගෙන ඇති අතර, විශාල කොටසක් උපයාගෙන ඇත්තේ අනෙකුත් මාර්ගයන්ගෙන් ලබාගත් වගකීම් වලින් බවත් පෙන්නුම් කෙරේ. මෙයින් පෙනී යන්නේ මහ බැංකුවේ වත්කම් වැඩිවීමෙන් හටගත් ප්‍රසාරණාත්මක බලපෑම මුළු වත්කම් වැඩිවීමේ ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස අඩු බවයි.

## ග්‍රාමීය ණය

1977 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 448 ක් වූ සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේත්, ග්‍රාමීය බැංකු ක්‍රමය යටතේත්, ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පිහිටි ලංකා බැංකු උප කාර්යාල මගිනුත් දී ඇති ණය ප්‍රමාණය 1978 වර්ෂයේදී සියයට29 කින් අඩුවී රුපියල් දශලක්ෂ 320 ක් විය. මෙම වර්ෂයේදී, මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 254 නැතහොත් සියයට 79 ක් හෝග වගාව සඳහා විය. මහජන බැංකුව රුපියල් දශලක්ෂ 148 ක් නැතහොත් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 46 ක් දී ඇති අතර ලංකා බැංකු උප කාර්යාල මගින් රුපියල් දශලක්ෂ 142 ක් නැතහොත් සියයට 44 ක් දී ඇත.

---

* ආසියානු නිශ්කාෂණ සංගමය යනු, සාමාජික රටවල් අතර එනම්; ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්ථානය, නේපාලය, අයිරානය, බංගලාදේශය හා බුරුමය යන රටවල ගණුදෙනු පියැවීම පහසුකරලීමේ නිශ් කාෂණ යන්ත්‍රණයකි. මේ යටතේ සාමාජික රටක් වෙනුවෙන් ඇති සියලුම ගෙවීම් එම රටට ඇති ලැබීම් මගින් බහුපාර්ශවීය ලෙස පියවනු ලබන අතර, ශුද්ධ ශේෂය මාස දෙකකට වරක් පියවනු ලැබේ. එසේ පියවා ඉතිරි ශේෂයක් වේතොත් එය සහ ලේඛන ගතව නොමැති ප්‍රමාණයන් මහ බැංකුවේ අනෙකුත් වත්කම්, වගකීම් වශයෙන් පෙන්නුම් කෙරේ.

## 1·18 වැනි සංඛ්‍යා : සටහන

### ග්‍රාමීය ණය ක්‍රම යටතේ දෙන ලද වගා ණය[1] (1978 දෙසැම්බර් 31 දිනට තත්ත්වය)

(රුපියල් දශලක්ෂ වලින්)

| වගා වර්ෂය | දෙන ලද ණය ප්‍රමාණය | | | ආපසු අයකර ගැනීම් | | | ආපසු අයකර ගැනීම් ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අනෙකුත් භෝග | සියලුම භෝග | වී | අනෙකුත් භෝග | සියලුම භෝග | වී | අනෙකුත් භෝග | සියලුම භෝග |
| 1967/68 – 1969/70 .. | 180·1 | 19·4 | 199·5 | 128·6 | 15·5 | 144·1 | 71·4 | 79·9 | 72·2 |
| 1970/71 – 1972/73 .. | 88·2 | 24·8 | 113·0 | 57·2 | 19·0 | 76·2 | 64·8 | 76·6 | 67·4 |
| 1973/74 .. .. | 111·1 | 26·2 | 137·3 | 58·7 | 15·3 | 74·0 | 52·8 | 58·4 | 53·9 |
| 1974/75 .. .. | 85·6 | 27·3 | 112·9 | 43·6 | 15·5 | 59·1 | 50·9 | 56·8 | 52·3 |
| 1975/76 .. .. | 72·2 | 36·4 | 108·6 | 42·4 | 16·5 | 58·9 | 58·7 | 45·3 | 54·2 |
| 1976/77 .. .. | 98·8 | 78·8 | 177·6 | 43·6 | 21·3 | 64·9 | 44·1 | 27·0 | 36·5 |
| 1977/78 .. .. | 452·7 | 81·4 | 534·1 | 97·3 | 18·4 | 115·7 | 21·5 | 22·6 | 21·7 |
| එකතුව .. | 1,088·7 | 294·3 | 1,383·0 | 471·4 | 121·5 | 192·9 | 43·3 | 41·3 | 42·9 |
| 1978/79[2] .. .. | 23·3 | 2·1 | 25·4 | 0·3 | ... | 0·3 | 1·3 | ... | 1·2 |

මූලයන්: මහජන බැංකුව.
ලංකා බැංකුව.
සීමාසහිත හැටන් නැෂනල් බැංකුව.

1· 1973 දක්වා නව කාෂිකාර්මික ණය ක්‍රමය යටතේ ණය දෙන ලදී.
එතැන් පටන් මේ ක්‍රමය වෙනුවට හඳුන්වා දුන් සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ණය දී ඇත.

2· අසම්පූර්ණ දත්ත මහ කන්නය සඳහා පමණි.

වී වගා ණය රුපියල් දශලක්ෂ 177 ක් හෝ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 55 ක් පමණ වූ අතර මින් වැඩි ප්‍රමාණයක් දී ඇත්තේ සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේය. අතිරේක ආහාර භෝග වගාව සඳහා මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 61 ක් නැතහොත් සියයට 19 ක්ද උක් සහ කපු වගාව සඳහා රුපියල් දශලක්ෂ 16 ක් නැතහොත් සියයට 5 ක් පමණ ද දී ඇත. නිවාස ගොඩනැගීම, විද්‍යුත්කරණය සහ ජල සම්පාදන ආදී විවිධ කටයුතු සඳහා ගොවි ජන සේවා ආයතනයන්හි පිහිටි ලංකා බැංකු උප කාර්යාල මගින් සහ ග්‍රාමීය බැංකු මගින් දී ඇති ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17 ක් විය. ලංකා බැංකු උප කාර්යාල මගින් යන්ත්‍ර සහ උපකරණ ගැනීම සඳහා දෙන ලද ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 1977 දී රුපියල් දශලක්ෂ 1 ක්වූ මෙම ණය ප්‍රමාණය 1978 දී රුපියල් දශලක්ෂ 30 දක්වා වැඩිවිය. මෙම වැඩි වීම ආනයන ලිහිල් කිරීමේ ප්‍රතිඵලයකි.

වර්ෂය අවසානයේදී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1978/79 නොනිමි මහ කන්නයේ වී වගාව සඳහා දුන් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 23 ක් විය. රුපියල් දශලක්ෂ 293 ක්වූ ඉකුත් වර්ෂයේ සමකාලීන ණය දීමනා හා සලකන විට මෙය ඉතා සුළු ප්‍රමාණයකි. එමෙන්ම, අතිරේක ආහාර භෝග, උක් සහ කපු වගාව ආදිය සඳහා දුන් ණය ද සිවු ගුණයකටත් වඩා අඩුවී ඇත. අප්‍රේල් මාසය පමණ වන තෙක් මහ කන්නය පවතින හෙයින් මුළු කන්නය සඳහාම වූ ණය දීම් සුළු වශයෙන් වර්ධනය වීමට ඉඩ ඇති නමුත් දෙන ලද ප්‍රමාණය ඉකුත් මහ කන්නයට වඩා සැලකිය යුතු ලෙස අඩුවී ඇත.

1977 දී ණය ලැබීමේ සුදුසුකම් පිළිබඳ කොන්දේසි ලිහිල් කිරීමේ හේතුවෙන් 1977/78 මහ කන්නයේදී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දුන් ණය ප්‍රමාණය විශාල ලෙස වර්ධනය විය. මෙම වර්ධනයත් සමඟම ණය ආපසු අය කර ගැනීම කාර්යක්ෂමව සිදු නොවූ හෙයින් මෙම කන්නයේදී ණය ආපසු නොගෙවීමේ ඉහලම අනුපාතයද වාර්තා වුනි.

ඒ අනුව 1978 වර්ෂයේදී කෘෂිකාර්මික ණය පැහැර හැරීම් අනුපාතයේ තියුණු වර්ධනයක් දක්වීන. 1·18 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි නව කෘෂිකාර්මික ණය ක්‍රමය ඇරඹීමෙන් පසුව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ බැංකු මගින් දී ඇති මුළු වී වගා ණය ප්‍රමාණය 1977/78 මහ කන්නය වන විට රුපියල් දශලක්ෂ 1,089 ක් විය. 1978 අවසානය වන විට, මෙම ණය ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 617 ක් හෝ සියයට 56 ක් නොගෙවා පැහැර හැර තිබුනි.

1977 සහ 1978 මුල් කාලයේදී වගා ණය, ඉතා විශාල ලෙස වර්ධනය වීමත්, අවදානම් දනවන අනුපාතයකින් ගෙවීම් පැහැර හැරීම් ප්‍රමාණය වැඩිවීමත් නිසා 1978 දී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය නැවත සකස් කිරීමට රජයට සිදුවිය. 1978 යල කන්නයේ දී ණය දීමේ කොන්දේසි දැඩි කෙරින. 1978 යල කන්නය සඳහා ණය ලබා ගැනීමේදී 1977/78 මහ කන්නයේ වගා ණය මුළුමනින්ම ගෙවීමට සිදුවිය. 1977/78 මහ කන්නයට පෙර ගත් ණය සඳහා ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණයෙන් සියයට 10 ක අවම මුදලක් එකවර ගෙවීමටද සිදුවිය. 1978/79 මහ කන්නය සඳහාද මෙම කොන්දේසි ක්‍රියාත්මක කෙරින. මෙයට අමතරව, මහ කන්නයේ ණය ලබා ගැනීම සඳහා 1978 යල කන්නය සඳහා වූ ණය මුළුමනින්ම ගෙවීමට ගොවිනට සිදුවිය. මෙම ක්‍රියාවලිය ඉකුත් වසරේ විවෘත ණය පහසුකම් ක්‍රමයට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ වූවක් විය.

මහ බැංකුව මගින් ක්‍රියාත්මක කෙරුනු සියයට 75 ණය ඇප ආවරණය ඉවත් කර ගැනීම සපිරි ග්‍රාමීය ණය ක්‍රමයෙහි වූ තවත් ප්‍රධාන වෙනසකි. මෙම ඇප ආවරණය 1967 නව කෘෂිකාර්මික ණය ක්‍රමය සමඟ හඳුන්වා දුන්නක් විය. මෙම ඇප ආවරණ ක්‍රමය යටතේ, වෙළඳ බැංකු මගින් දී ඇති වගා ණය ප්‍රමාණයෙන් නොගෙවා පැහැර හැරීම් වලින් සියයට 75 ක් දක්වා රජය වෙනුවෙන් මහා බැංකුව ඇපවිය. වසර කීපයක් මුළුල්ලේ වූ වගාණය ප්‍රසාරණයට මෙම ක්‍රමය හේතුවිය. නමුත් එවැනි ඉහළ මට්ටමක ඇප ආවරණය ක් ණය දෙන බැංකු ණය ආපසු අයකර ගැනීම සම්බන්ධව මන්දෝත්සාහි කිරීමට හේතු වන්නට ඇත. ඇප ආවරණය

ඉවත් කිරීම නිසා බැංකු කරුවන් ණය දීමේදී වඩාත් සුපරීක්ෂාකාරී වනු ඇති අතර ඒ නිසා කෘෂිකාර්මික ණය මට්ටම අඩුවී සමහරවිට 1977 ට පෙර තත්ත්වයට පැමිණීමට ඉඩ ඇත. නිසැකවම 1977 අවසාන කාලයේදී කෘෂිකාර්මික ණය ක්‍රමය හදිසියෙන්ම ලිහිල් කිරීම අදූරදර්ශී ක්‍රියාවක් විය. සාමාන්‍යයෙන් කෘෂිකාර්මික ණයෙන් අයථා ප්‍රයෝජන ගැනීම විශාල වශයෙන් සිදුවේ. නමුත් එවැනි අයථා ප්‍රයෝජනයන් හේතුවෙන් කෘෂිකාර්මික ණය සාමාන්‍ය වාණිජ බැංකු ණය ක්‍රමය යටතට පත් කිරීම ප්‍රමාණයට වඩා තදබල පියවරකි. කෙටි කාලයකදී ණය අධීක්ෂණ කටයුතු කළහැකි වන සේ ඇප ආවරණය පියවරින් පියවර ඉවත් කලේ නම් වඩා යෝග්‍ය වන්නට තිබුනි.

## මූල්‍ය ප්‍රතිපත්තිය

පිළිවෙලින් දෙවෙනි වසරටත් තියුණු මූල්‍ය ප්‍රසාරණ පසුබිමක් පැවති 1977 දී මූල්‍ය ප්‍රතිපත්ති සීමාවන් රැසක් හඳුන්වා දෙන ලද බව එම වර්ෂයේ වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. මේවායින් ප්‍රධාන ඒවා වූයේ, 1977 අගෝස්තු මස 31 වනදා සිට බැංකු පොලී අනුපාතිකය සියයට 10 ක් කිරීම, බැංකු පොලී අනුපාතිකය යටතේ මහ බැංකුවෙන් වෙළඳ බැංකුවලට දෙන ණය සීමා කිරීම හා මෙම සීමාව ඉක්මවන ණය දීම සඳහා සියයට 15 ක දණ්ඩන පොලියක් ඇති කිරීම, කැට මුදල් සහනය ක්‍රමිකව අඩුකිරීම හා 1977 දෙසැම්බර් 2 දින සිට එම සහනය මුළුමනින්ම ඉවත් කිරීම සහ අත්‍යවශ්‍ය නොවන අරමුණු සඳහාත් ණය දීම සහ කුලීපිට ගැනුම් කටයුතුවල යෙදී සිටින බැංකු නොවන ආයතන සඳහාත් දෙනු ලබන අත්තිකාරම් සීමාවන් තවදුරටත් පවත්වා ගැනීමත්ය. එම වර්ෂයේදී පනවන ලද තවත් වැදගත් මූල්‍ය ප්‍රතිපත්තියක් වූයේ 1977 සැප්තැම්බර් 7 වන දින සිට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු අනුපාතිකයන් තියුණු ලෙස ඉහල නැංවීමයි. මේ හා සමග වෙළඳ බැංකුවල තැන්පතු හා ණය අනුපාතිකයන්හිද වැඩි කිරීමක් සිදුවිය.

1978 වර්ෂය තුලදී, ඉහත දක්වූ මූල්‍ය ප්‍රතිපත්ති සමූහයේ තියුණු කිරීමක් හෝ ලිහිල් කිරීමක් සම්බන්ධයෙන් වූ ප්‍රධාන වෙනස්කම් කිසිවක් සිදු නොවීය. 1978 මාර්තු 27 වන දින සිට ණයදීමේ සහ කුලිපිට ගැනුම් කටයුතුවල යෙදී සිටින බැංකු නොවන ආයතන සඳහා වූ වෙළඳ බැංකු ණය සීමාව, ප්‍රාග්ධන උපකරණ සහ ව්‍යාපාරික කටයුතු සඳහා යොදගනු ලබන අලුත් වාහන සඳහා මුදල් සම්පාදනය කෙරෙන පරිද්දෙන් ලිහිල් කරන ලදී. 1978 ජුනි මාසයේ සිට රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට දෙනු ලබන වෙළඳ බැංකු ණය සීමා කිරීමට උත්සාහයක් දරිමක් වශයෙන් 1978 ජුනි මස 28 වන දිනට නොපියවා පැවති ණය ප්‍රමාණය නොඉක්මවන පරිද්දෙන් සීමාවක් පනවන ලදී. කෙසේ-වුවද, මේ සම්බන්ධයෙන් ඇතැම් දුෂ්කරතා ඇතිවූයෙන් එම ආයතනවල වැඩිවූ ණය අවශ්‍යතා සපුරාලීමට මෙම සීමාව අවස්ථා කිහිපයකදීම වෙනස් කිරීමට සිදු විය. මේ අනුව, 1978 ජුනි මස 28 වන දිනට නොපියවා පැවති රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල (මූල්‍ය හා ණය දෙන ආයතන හැර) වෙළඳ බැංකු අත්තිකාරම් ප්‍රමාණය මුළු වශයෙන් සියයට 17 කින් වැඩි කිරීමට හැකිවන පරිද්දෙන් මෙකී සීමාව ජුලි මස 13 වන දිනදී සියයට 5 කින්ද, අගෝස්තු මස 7 වන දින දී සියයට 12 කින්ද වැඩිකරන ලදී.

ඉහත දක් වූ පරිදි, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා වූ පහසුකම්වල සුළු වෙනස් කිරීම් කිහිපයක්ද 1978 වර්ෂය තුලදී හඳුන්වා දෙන ලදී. එක් අවුරුද්දක් සඳහා වූ කාලීන තැන්පතු වලට වර්ෂයකට සියයට 14·4 බැගින් වූ මාසික පොලී ගෙවීමද, මාස 18 ක් සඳහා වූ කාලීන තැන්පතුවලට (රුපියල් 5000 ක අවම තැන්පතුවකට යටත්ව) වර්ෂයකට සියයට 16·8 ක් බැගින් වූ මාසික පොලී ගෙවීමද, නව කාලීන තැන්පතුවලට (මාසික පොලී ගෙවීමට යටත් නැති) සහ කල් නොපිරුණු කාලීන තැන්පතු වෙනුවෙන් එකී තැන්පතු පැවති කාලසීමාවන් අනුව වෙනස්වන අනුපාතිකයන් යටතේ පොලී ගෙවීමද මෙයට ඇතුළත් විය.

UNIVERSITY OF MORATUWA LIBRARY

ඉහතදී සාකච්ඡා කළ පරිදි, 1978 වර්ෂය ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවූ වර්ෂයක් විය. 1978 ජනවාරි මාසයේ දී සියයට 35 ක්ව පැවති වාර්ෂික මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය 1978 දෙසැම්බර් මාසය වන විට සියයට 11 දක්වා වූ ප්‍රමාණයකට අඩුවිය. වර්ෂය තුලදී අනුගමනය කළ දැඩි මූල්‍ය ප්‍රතිපත්තීන් මෙම මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය අඩුකිරීමට සැලකියයුතු ලෙස ඉවහල් වූ බවට සාක්ෂි ඇත. මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ පසුබෑමට දයක වූ ප්‍රධාන සාධකය රාජ්‍ය අංශයේ මූල්‍ය කටයුතු වූවද, බැංකු නොවන පෞද්ගලික අංශය සතු බැංකු ක්‍රමය වෙතැති කාලීන හා ඉතුරුම් තැන්පතුවල සැලකියයුතු වැඩිවීමද මේ සඳහා බොහෝ දුරට ඉවහල් වූ සාධකයක් විය. සමස්ත වශයෙන්, වර්ෂය තුලදී බැකු නොවන පෞද්ගලික අංශය සතු වෙළඳ බැංකුවල පැවති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,605 කින් වැඩි විය. මේ නිසා, දැඩි උද්ධමනකාරි තත්ව යක් ඇති නොකෙරෙන පරිද්දෙන් තියුණු ලෙස වැඩිවූ පෞද්ගලික අංශයේ ණය අවශ්‍යතා සපුරාලීමට වෙළඳ බැංකුවලට හැකි විය. මේ අනුව, වර්ෂය තුලදී පෞද්ගලික අංශයට දුන් ණයෙහි රුපියල් දශලක්ෂ 3,026 ක වාර්තාගත වැඩිවීමක් තිබියදීත්, එකී අංශයෙන් ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 688 කට සීමා වුණි. එමෙන්ම, කැට මුදල් සහනය ඉවත් කිරීම වැනි මූල්‍ය ප්‍රතිපත්තීන් නිසා ණය මුදල් මැවීමට පදනම් විය හැකිව තිබූ සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් වෙළඳ බැංකු වෙතින් ලබාගැනීමට මහ බැංකුවට හැකිවිය. එමෙන්ම, දණ්ඩන පොලී අනුපාතිකය ක්‍රියාත්මක කිරීම මගින් වෙළඳ බැංකු විසින් මහ බැංකුව වෙතින් විශාල ප්‍රමාණයන්ගෙන් ණය ලබා ගැනීම අධෛර්යමත් කෙරුණි.

ඉහතින් සඳහන් කළ කරුණු අනුව, 1977 දී ක්‍රියාත්මක කළ හා 1978 වර්ෂය මුළුල්ලේ තවදුරටත් පවත්වා ගත් මූල්‍ය ප්‍රතිපත්ති සීමාවන් නොවන්නට මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගය වර්ෂය තුලදී සැලකිය යුතු ලෙස වැඩි වන්නටත් මූල්‍ය ප්‍රසාරණ වර්ධන වේගයේ අපේක්ෂිත පසු-බෑම තවදුරට කල්පමාවීමටත් ඉඩ තිබුණි. 1977 දී ක්‍රියාත්මක කළ සහ 1978 වර්ෂය මුළුල්ලේ තවදුරටත් පවත්වා ගත් මූල්‍ය ප්‍රතිපත්ති සමූහයේ යෝග්‍යබව සළකා බැලිය යුතු වන්නේ මෙවැනි පසුබිමක් මතය. ණය පහසුකම් නොමැතිකම සහ ඒ සඳහා වූ ඉහළ මිල සම්බන්ධයෙන් ඇතැම් අවස්ථාවල චෝදනා කිරීම් තිබුණි. මෙයින් මුලින් සඳහන් කළ කරුණ, එනම්; ණය පහසුකම් නොමැතිකම, එකල ක්‍රියාත්මකව පැවති ණය සීමාවන් නිසා ඇති වූවද, ආර්ථිකයේ ඇති වූ ණය අවශ්‍යතාවයන්ගේ වැඩිවීම සපුරාලීමට බැංකු ක්‍රමයට හැකිවූ බවත් 1978 වර්ෂය තුලදී සිදුවූ සැලකියයුතු මූල්‍ය ප්‍රසාරණයමගින් පෙන්නුම් කෙරුණි. ණය මුදල්වල ඉහල මිළ සම්බන්ධයෙන් වූ චෝදනාවන්, දිගු කාලයක් සඳහා අඩු මිලකට ණය ලබාගැනීමට පුරුදුව සිටි අයගේ ප්‍රතිචාරයක් බව පෙනී යයි. 1976 වර්ෂයේ සිට නොකඩවා පැවති සීඝ්‍ර උද්ධමනකාරී පසුබිමක් යටතේ ඉතිරි කිරීම් සඳහා සානුබලයන් ලබාදීම සහ සම්පත් ඒකරාශිකරණයට දැඩිසේ බාධාවක් ඇති නොකෙරෙන පරිද්දෙන් අඩු පොලී අනුපාතික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේදැයි සිතීම අපහසුය. දැනට පවත්නා කෙටිකාලීන ඉහල පොලී අනුපාතික ප්‍රතිපත්තීන්, අර්ථිකය දැඩි උද්ධමනකාරී බැඳීම් වලින් මුදවා ගැනීමටත්, සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ලබාගැනීම සඳහා අත්‍යවශ්‍ය වූ මූල්‍ය ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමටත් අවශ්‍යයෙන්ම කළ යුතුව ඇති ගෙවීමක් වේ.